ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2023 . 08 . 23 |

පැමිණිලි පාර්ශවය : ඩබ්ලිව්. වින්සන් මහතා,
අංක : 233/81 බී, හේනමුල්ල කදවුර,
මාදම්පිටිය, කොළඹ 14.

අගතියට පත් අය : විතානගේ චින්තක සමන් කුමාර

වගඋත්තරකරු :

1. ස්ථානාධිපති, (2015 වර්ෂයේ සේවයේ නියුතුව සිටි)
පොලිස් ස්ථානය,
වැලිකඩ.

2. උ.පො.ප. කේ.ජේ.එස්.ප්‍රියන්ත මහතා,
ස්ථානාධිපති, අපරාධ අංශය,
පොලිස් ස්ථානය,
වැලිකඩ.

3. උ.පො.ප. ආර්.එම්.එස්.එම්.රත්නායක මහතා,
පොලිස් ස්ථානය,
වැලිකඩ.

4. පො.කො. 38723 බී.ටී.රංජිත් මහතා,
පොලිස් ස්ථානය,
වැලිකඩ.

<u>පැමිණිලි අංකය : **HRC/1604/15**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාර ඩබ්. වින්සන් යන අය විසින් 2015.05.15 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමාගේ පුතා වන විතානගේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

චින්තක සමන් කුමාර යන අයව 2015.05.04 වන දින සොරකමක් සම්බන්ධයෙන් වැලිකඩ පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන අමානුෂික අන්දමින් පහර දී ඇති බවත්, ඒ හේතුවෙන් ඔහු බරපතල ලෙස තුවාල ලැබීම මත 2015.05.06 වන දින කොළඹ මහ රෝහලේ හදිසි අනතුරු ඒකකයට ඇතුලත් කර ප්‍රතිකාර ලබාගත් බවත්ය. පසුව 2015.05.07 වන දින අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, පසුව අධිකරණයෙන් ඇප මත නිදහස්ව ඇති බවද දක්වා ඇත.

අගතියට පත් විතානගේ චින්තක සමන් කුමාර යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එම ප්‍රකාශයේ සඳහන් වන්නේ, තමා JCB යන්ත්‍ර රියදුරෙක් වශයෙන් කටයුතු කළ බවත්, පොලිසිය විසින් කරන ලද දැනුම්දීමක් මත 2015.05.02 වන දින පැය 15.00 ට පමණ වැලිකඩ පොලිස් ස්ථානය වෙත ගිය බවත්ය. පසුව ස්ථානාධිපති ලෙස කටයුතු කළ නිලධාරියා වෙත තමාව යොමු කළ අතර, ඔහුගේ නියෝග පිට සිර මැදිරියේ රඳවා තබා ගත් බවත්, එසේ සිර මැදිරියේ දින 04 ක් රඳවා තබා ගන්නා ලද බවත් සඳහන් කර ඇත. 04 වන දින උදෑසන 8.00 ට පමණ සිර මැදිරියෙන් එළියට ගෙන අපරාධ අංශය වෙත රැගෙන ගොස් එහි වැසිකිලියට රැගෙන ගිය අතර, තමාව වැසිකිලියට රැගෙන යන ලද්දේ රංජිත් නැමැති නිලධාරියෙකු විසින් බවද සඳහන් කර ඇත. වැසිකිලියට ගොස් ඇඳුම් ගැලවීමට නියෝග කළ අතර, තමා විසින් යටට ඇඳ සිටි කුඩා කලිසම හැර අන් සියළුම ඇඳුම් ඉවත් කළ බවත්, ඉන්පසු අත් දෙක ඔසවා වදින ආකාරයට දෑත් එකතු කිරීමට කටයුතු කළ අතර, පසුව අත්දෙක රෙදි පටියකින් බැඳ ත්‍රීවිල් ජැක් එකක් උපයෝගී කරගෙන රෙදි පටියේ ගැටය තද කර වැසිකිලියේ බිම දිගාවීමට සලස්වා පයින් බඩ ප්‍රදේශයට පහරදුන් බවත්, කකුල් වල කලවා පෙදෙස් වලට ක්‍රිකට් පොල්ලකින් පහරදුන් බවත් සඳහන් කර ඇත.

එසේ පහරදෙන අතරතුර "උඹේ අතපය කඩා දානවා" යනුවෙන් ප්‍රකාශ කරමින් වැසිකිලිය තුළ තිබූ කැඩී බිඳී ගිය සින්ක් එකක් මත කකුල තබා එම කකුලට බර දී තද කළ බවත්, මේ අවස්ථාවේදී කැඩී තිබූ සින්ක් එකට කැපීමෙන් කකුලට හානි වූ බවත්, එමනිසා අධික ලෙස ලේ වහනය වූ බැවින් බියට පත් වූ නිලධාරීන් අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා එම උපදෙස් මත ප්‍රතිකාර කිරීම සඳහා රාජගිරිය ප්‍රදේශයේ ස්ථාන තුනකට ගිය බවත්, මෙම ස්ථාන වලින් තමාට ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂේප කළ බවත් සඳහන් කර ඇත. පසුව ජාතික රෝහලට ඇතුලත් කළ බවත්, ජාතික රෝහලේදී ප්‍රකාශයක් ලබාදීම සඳහා රෝහල් පොලිසිය වෙත යොමු කළ අතර, අදාළ නිලධාරීන් විසින් රෝහල් පොලිසිය වෙත තමා විසින්ම කකුල කපා ගත් බවට දන්වන ලද අතර, එහිදී තමා විසින් ද ඔවුන්ට ප්‍රකාශයක් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. ඒ සම්බන්ධයෙන් වෛද්‍යවරයා වෙත තමා විසින් කරුණු ඉදිරිපත් කළ අතර, රෝහලේ සිටි අසල්වැසියෙක් මාර්ගයෙන් නිවැසියන් දැනුවත් කිරීම මත ඔවුන් තමා බැලීමට රෝහලට පැමිණි

බවත්, දින 03 ක් රෝහල් ගතවී සිටි බවත්, මහේස්ත්‍රාත්තුමිය රෝහලට පැමිණ තමා පරීක්ෂා කර බලා ඇප ලබාදුන් බවත්, ඇප ලබා ගැනීමට අවශ්‍ය ග්‍රාම නිලධාරි සහතිකය නොමැති වීම නිසා බන්ධනාගාර ගත වී දින දෙකකට පසුව ඇප මත නිදහස් වූ බවත් දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වැලිකඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත නිකුත් කර ඇති 2016.07.13 දිනැති සිතාසිය ප්‍රකාරව අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකළ වැලිකඩ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති, උ.පො.ප. කේ.ජේ.එස්. ප්‍රියන්ත, උ.පො.ප. ආර්.එම්.එස්.එම්. රත්නායක සහ පො.කො. 38723 බී.ටී. රංජිත් යන නිලධාරින් 2016.07.29 දින පැවැති පරීක්ෂණ කටයුතු සඳහා සහභාගි වී ඇත.

පළමුවන වගඋත්තරකරු ලෙස වැලිකඩ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ උප පොලිස් පරීක්ෂක, කේ.ජේ.එස්.ප්‍රියන්ත මහතා ප්‍රකාශ කර ඇත්තේ, ත්‍රීවිල් රථයක් සොරකම් කිරීම සම්බන්ධයෙන් ස්ථානයට වාර්තා වූ බල අපරාධ 53/15ට දරණ පැමිණිල්ලට අදාළව තමා විසින් විමර්ශනය කළ බවත්, එම සිද්ධියට අදාළව CCTV දර්ශන පරීක්ෂා කිරීමෙන් අදාළ සොරකමට පුද්ගලයන් දෙදෙනෙක් සම්බන්ධ බව අනාවරණය වූ බවත්, එහිදී එක් පුද්ගලයෙක් හඳුනාගත් බවත්, ඔහු හීනැටිකුඹුරේ පදිංචි චන්දන ලෙස හඳුනා ගැනීමෙන් පසුව මෙම පුද්ගලයා මීට පෙර සොරකම් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයෙක් බවත්, ඒ අනුව අදාළ විමර්ශනයන් සිදුකිරීමේදී මෙම පුද්ගලයාව මුල්ලේරියාව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන සිදුකරන ලද විමර්ශනයේදී මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ද කරුණු අනාවරණය වීමෙන් පසු එම පුද්ගලයාගෙන් ප්‍රශ්න කිරීමේදී මෙම ත්‍රීවිල් සොරකමට සම්බන්ධ වූ අනෙක් පුද්ගලයා චින්තක සමන් කුමාර ලෙස හඳුනාගත් බවත් දක්වා ඇත. ඒ පිළිබඳව කරන ලද පරීක්ෂණයකින් පසුව 2015.05.06 වන දින උ.පො.ප. රත්නායක විසින් සොරකම් කරන ලද ත්‍රීවිල් රථයේ කොටසක් සොයා ගන්නා ලද අතර, පසුව අදාළ සැකකරුවන්ව 2015.05.06 වන දින අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් අධිකරණය වෙත කරුණු වාර්තා කර ගරු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ බවත් දක්වා ඇත. තවද, මෙම පුද්ගලයාව ඉන් පසුවද මහා පරිමාණයේ හෙරොයින් ළඟ තබා ගැනීම යටතේ ග්‍රෑන්ඩ්පාස් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන මහාධිකරණයේ නඩුගොනු කර ඇති අතර, ඉන් පෙර ද මෙම පුද්ගලයාට විරුද්ධව මිනීමැරුමක් සම්බන්ධයෙන් නඩුවක් පවතින බවද මෙම අය අධික ලෙස මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයෙක් බව ද සඳහන් කර ඇත. එසේම, මොහුව අත්අඩංගුවට ගෙන ප්‍රකාශ සටහන් කර ගන්නා අවස්ථාවේදී මොහු අධික ලෙස මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ පුද්ගලයෙක් නිසා මත්ද්‍රව්‍යය නොලැබීම නිසා සිහිවිකල් පුද්ගලයෙක් ලෙස කටයුතු කළ බව ද සඳහන් කරඇත.

දෙවන වගඋත්තරකාර උ.පො.ප. රත්නායක යන අය ප්‍රකාශ කර ඇත්තේ, අදාළ ත්‍රිවිල් රථය සොරකම් කිරීම සම්බන්ධයෙන් 2015.05.06 වන දින අංගොඩ හන්දියේදී මෙම අය අත්අඩංගුවට ගත් බවත්, එසේ අත්අඩංගුවට ගනු ලැබුවේ CCTV කැමරා දර්ශන විමර්ශනය කිරීමෙන් පසුව බවත්ය.

තුන්වන වගඋත්තරකාර පො.කො. 38723 රංජිත් යන අය ප්‍රකාශ කර ඇත්තේ, වැලිකඩ පොලිස් ස්ථානයේ බල අපරාධ ලේඛනයේ අංක : 53/2015 යටතේ 2015.04.13 වන දින ලද පැමිණිල්ල අනුව ත්‍රිරෝද රථයක් සොරකම් කිරීම සම්බන්ධයෙන් මෙම සැකකරුගේ ප්‍රකාශයන් සටහන් කරන ලද බවත්, ප්‍රකාශය ගැනීමේදී අනාවරණය වූයේ මීට පෙර මුල්ලේරියාව පොලිස් ස්ථානයෙන් අත්අඩංගුවට ගත් චන්දන යන අය සමග සම්බන්ධතා පවත්වන ලද බවත්, එම ත්‍රිරෝද රථය කොටස් කර බුද්ධික නැමැති අයගේ බෝඩිමේ සහ චන්දන නැමැති අයගේ නිවසේ සඟවා ඇති බවත් ප්‍රකාශ කරන ලද බවත්ය. ඒ අනුව ත්‍රිරෝද රථයේ කොටස් සියල්ල සොයා ගත් අතර, සැකකරු දැඩි ලෙස හෙරොයින් වලට ඇබ්බැහි වූ අයෙක් බැවින් මෙම අයව පුටුවේ ඉන්දවා මාංචු දමා ප්‍රකාශ සටහන් කළ බවත්, එසේ ප්‍රකාශ සටහන් කරන විට හෙරොයින් නොමැතිකම නිසා මොහුට පවතින අපහසුතාවයන් මත එම ස්ථානයේදීම මලපහ පිටවූ බවත්, ඉන්පසුව අපරාධ අංශයට ආසන්නව පවතින වැසිකිළියට මොහු රැගෙන ගොස් එහි දොර වැසූ අතර වැසිකිළියට යාමට පෙර විලංගු ඉවත් කළ බවත් සඳහන් කර ඇත. පසුව ටික වේලාවකින් මොහු කෑගනු ඇසී බලන විට මොහු කැඩුනු කොමඩ් එකක් මත වැටී සිටි බැවින් නිලධාරීන් සමග මෙම අයව එළියට ගෙන වතුර බාල්දියකින් අතපය සෝදා ඔහුගේ කකුල කැපී තිබූ නිසා ස්ථානයේ තිබූ ප්‍රථමාධාර පෙට්ටියෙන් වෙළුම් පටි ගෙන වෙළුම් කර ස්ථානාධිපතිට දන්වා රෝහලට රැගෙන ගොස් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව හදිසි අනතුරු ඒකකයට ඇතුළත් කළ බවත් සඳහන් කර ඇත.

**අධිකරණ වෛද්‍ය වාර්තාව =:**

වින්දිතයාට අදාළව කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරීගේ වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව වින්දිත තැනැත්තාගේ තුවාල සම්බන්ධයෙන් පහත පරිදි කරුණු දක්වා ඇත.

2020.08.18 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් පැමිණිලිකරුගේ ශරීරයේ නිරීක්ෂණයට ලක් වූ තුවාල 10 ක් පිළිබඳව සඳහන් කර ඇත.

1. දකුණු බාහුවේ තිරස් වළලු ලෙස දැකිය හැකි 4cm×1cm සහ 5cm×1cm ප්‍රමාණයේ සීරීම් තුවාල සලකුණු

2. වම් බාහුවේ ආනතව පහළට 5cm×2.5cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක්.

3. දකුණු පාදයේ පහළ කොටසේ (shin) ඇති අර්ධ වශයෙන් සුව වූ සීරීම් තුවාලයක්.

4. දකුණු පාදයේ වළලුකර අසල ඇති අර්ධ ලෙස සුව වූ 0.6cm විශ්කම්භයෙන් යුතු තුවාලයක්.

5. දකුණු පාදයේ ඇති 3cm දිග කැපුම් තුවාලයක්.

6. දකුණු පාදයේ වළලුකර පිටුපස ඇති 8cm දිග මැහුම් දමන ලද තුවාලයක් - මෙය රෝහලේ සටහන් කර ඇති කණ්ඩරාව (Achilles tendon) අර්ධ ලෙස කැපී ඇති බවට දක්වන සටහන් සමග සම්බන්ධ බවද දක්වා ඇත.

7. දකුණු පාදයේ වළලුකර අසල පහළට ආනතව සහ ඉදිරිපස දෙසට ඇති 5cm දිග මැහුම් දමන ලද තුවාලයක්.

8. වම් පාදයේ වළලුකර අසල තිබෙන අක්‍රමවත් හැඩයෙන් යුතු මැහුම් දමා ඇති තුවාල සමූහයක් (8cm×4cm) – මෙය රෝහලේ සටහන් කර ඇති අභ්‍යන්තර කණ්ඩරා වලට සිදුවූ තුවාල හා සම්බන්ධව බව දක්වයි.

9. වම් පාදයේ වළලුකර පිටුපස කොටසට ආසන්න ප්‍රදේශයේ ඇති 9cm ක් දිග මැහුම් දමන ලද තුවාලය - මෙයද රෝහලේදී සටහන් තබා ඇති අභ්‍යන්තර කණ්ඩරා වලට සිදුවූ තුවාල හා සම්බන්ධ බව දක්වා ඇත.

10. වම් පාදයේ විලුඹට 5cm ක් පමණ පහළින් ඇති 1cm විශ්කම්භයකින් යුතු සීරීම් තුවාලයක් ඇති බවට දක්වා ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු 2015.05.15 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති මුල් පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ තම පුතා වන විතානගේ චින්තක සමන් කුමාර යන අයව 2015.05.03 වන දින ප.ව 3.00 ට අත්අඩංගුවට ගත් බවත්, 2015.05.06 වන දින පොලිස් නිලධාරීන් විසින් මෙම අයට අමානුෂික ලෙස පහරදී ඇති බවත්, 2015.05.07 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්ය.

පැමිණිල්ලට අදාලව සිදුකරන ලද 2015.11.30 දිනැති පරීක්ෂණයේදී පැමිණිලිකරු විසින් සිය කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත්තේ, විතානයේ චින්තක සමන් කුමාර යන එනම්, මෙහි අගතියට පත් අය 2015.05.04 වන දින අත්අඩංගුවට ගන්නා ලද බවයි. තවද අගතියට පත් චින්තක සමන් කුමාර යන අය විසින් 2016.01.19 වන දින කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයේ සඳහන් වන්නේ තමාව 2015.05.02 වන දින අත්අඩංගුවට ගත් බවයි.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීමේ දී සඳහන් වන්නේ 2015.05.06 වන දින සැකකරුව අත්අඩංගුවට ගත් බවයි. පොලිස් ස්ථානය මගින් මෙම සැකකරුව 2015.05.07 වන දින අධිකරණයට ඉදිරිපත් කර ඇත.

මෙම කරුණු අනුව, අත්අඩංගුවට ගත් දිනය සම්බන්ධයෙන් පාර්ශවයන් ඉදිරිපත් කර ඇති කරුණු පරස්පර වන අතර, ඒ අනුව නීති විරෝධී ආකාරයට අත්අඩංගුවේ රඳවා තබා ගත් බවට පැමිණිල්ලෙන් ඉදිරිපත් කරනු ලබන චෝදනාව සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කිරීමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ.

නමුත්, පැමිණිලි පාර්ශවය හා වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම අනුව පැමිණිලිකරුගේ පුත්‍රයා වන චින්තක සමන් කුමාර යන අය පොලිස් අත්අඩංගුවට පත්ව ඇති බව නිරීක්ෂණය වේ.

කෙසේ නමුදු, චින්තක සමන් කුමාර යන අයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවේ බරපතල නොවන තුවාල 07 ක්ද, බරපතල තුවාල 03ක්ද සඳහන් වන අතර, වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට භාජනය වන අවස්ථාවේදී පහරදීම සම්බන්ධයෙන් කරන ලද කෙටි ඉතිහාසය හා ගැලපෙන බවයි. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව දක්වා ඇති තුවාල අතරින් 1, 2, 3, 4, 5, 7 සහ 10 යන තුවාල බරපතල ගණයේ තුවාල නොවන බවට දක්වා ඇති අතර, 6, 8, 9 යන තුවාල බරපතල තුවාල බවත් දණ්ඩ නීති සංග්‍රහයේ 311 වගන්තියේ සඳහන් කර ඇති ස්ථිර ආබාධයක් ඇති කළ හැකි තුවාල බව සඳහන් කර ඇත. එමෙන්ම 1, 2, 3, 4, 10

යන තුවාල මොට ආයුධයකින් සිදුවී ඇති බව සහ 5, 6, 7, 8, 9 යන තුවාල තියුණු කැපුම් ආයුධයකින් සිදුවී ඇති බවද දක්වා ඇත.

තවද, මෙම තුවාල සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක්වමින් වෛද්‍යවරයා සඳහන් කරන්නේ 1 2 යන තුවාල අතේ මැණික්කටුව සහ බාහුව ප්‍රදේශ මත යෙදූ තද ගැටගැසීමක් නිසා සිදුව ඇති බවයි. මෙම නිසා පැමිණිලිකරු ප්‍රකාශ කර ඇති අන්දමට ත්‍රීරෝධ රථයක ජැක් එකක් යොදා ඔහුගේ අතේ රෙදි පටිවලින් යොදා තිබූ ගැටය තද කළ බවට දක්වා ඇති ප්‍රකාශය සත්‍ය ප්‍රකාශයක් බව නිරීක්ෂණය කළ හැකිය. 'මෙම තුවාල සහ වාහන ජැක් එකක් යොදා ගනිමින් අත්වටා යොදා තිබූ ගැටය තද කළ බවට පැමිණිලිකරු කළ ප්‍රකාශය අතර වෙනසක් දැකිය නොහැකි බවට' වෛද්‍යවරයා යොදා ඇති සටහන මෙය තවදුරටත් සනාථ කරයි.

එමෙන්ම 3, 4 සහ 10 යන තුවාල , මතුපිටට මොට බලය යෙදීම නිසා සිදුවී ඇති බවද දක්වා ඇත. මෙමගින් නිරීක්ෂණය කළ හැක්කේ පැමිණිලිකරු විසින් ප්‍රකාශ කළ ආකාරයට 'ඔහුට පහරදීම් සිදුකළ බව' යන්නෙහි සත්‍යතාවයයි.

තවද, 5 6 7 8 9 යන කැපුම් තුවාල නිරීක්ෂණයේදී, එය වටා ඇති සලකුණු මගින් මෙම තුවාල රළු සහ අක්‍රමවත් කැපුම් මතුපිටක් නිසා සිදුවූ බවට පෙනී යන බව වෛද්‍යවරයා දක්වා ඇත. මෙහිදී ඔහු විසින් පෙන්වා දී ඇත්තේ තුවාල වල ස්වභාවය අනුව අක්‍රමවත් මතුපිටක් ඇති රළු තියුනු දාරයක් මගින් නැවත නැවතත් යෙදූ බලය හේතුවෙන් අභ්‍යන්තර කණ්ඩරා වලට තුවාල සිදුවී ඇති බවයි. මෙමගින් තහවුරු වන්නේ පැමිණිලිකරු විසින් කළ, "කැඩී බිඳී ගිය සින්ක් එකක් මත තම කකුල් තබා කකුලට බරදී තද කළ බවත්, එම අවස්ථාවේ කැඩී තිබූ සින්ක් එකට කැපී කකුලට හානි වූ බවටත්" කළ ප්‍රකාශය සත්‍ය බවයි.

වෛද්‍යවරයා විසින් සඳහන් කරන ලද, පැමිණිලිකරු විසින් දක්වන ලද ප්‍රකාශ හා තුවාල වල ස්වභාවය කිසිදු අයුරකින් වෙනසක් නොපෙන්වන බවට කළ ප්‍රකාශයෙන්ද පැමිණිලිකරුගේ ප්‍රකාශ වල සත්‍යතාවය තවදුරටත් තහවුරු කළ හැකිය.

පහරදීමේ චෝදනාව සම්බන්ධයෙන් කරුණු ප්‍රතික්ෂේප කරමින් වගඋත්තර පාර්ශවය සිය කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත්තේ, අගතියට පත් චින්තක සමන් කුමාර යන අයව අත් විලංගු ඉවත් කර වැසිකිළියට යාමට අවස්ථාව සලසා දුන් බවත්, මඳ වේලාවකින් වැසිකිළිය තුළින් කැ ගසන ශබ්ධයක් ඇසීම මත බැලීමේදී එම අය කැඩුනු කොමඩ් එකක් මත වැටී සිටි බවත්, ඒ හේතුවෙන් එම අයගේ කකුල කැපී තිබූ බවත්ය.

නමුත්, අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියාගේ තුවාල 10 ක් පැවතීම, එවැනි වැටීමක් මත සිදුවූයේද යන්න පිළිගත නොහැක. තවද අධිකරණ වෛද්‍ය වාර්තාවේ 1 සහ 2 තුවාල සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය මතය වන්නේ, අතේ මැණික් කටුව සහ බාහුව ප්‍රදේශ මත යෙදූ තද ගැටගැසීමක් නිසා සිදුව ඇති තුවාල වන බවයි. එය වගඋත්තර පාර්ශවය දක්වා සිටින ආකාරයේ වැටීමක් හේතුවෙන් සිදුවිය නොහැකි අතරම පැමිණිලිකරු විසින් දක්වන ලද "පටියකින් දෙඅත් තදින් බැඳීම" යන කාරණය මෙමගින් වඩාත් තහවුරු වේ. තවද 5, 6, 7, 8, සහ 9 යන තුවාල අක්‍රමවත් මතුපිටක් ඇති රළු තියුනු දාරයක් මගින් නැවත නැවතත් යෙදූ බලය හේතුවෙන් සිදුව ඇති තුවාල බවට දක්වා ඇති අතර, එය සිත්ක් එකක් මතට වැටීමෙන් සිදුවූ තුවාල බවට පිළිගත නොහැක. එසේම අදාළ තුවාල සම්බන්ධයෙන් වෛද්‍යවරයාගේ මතය ප්‍රකාශ කිරීමේදී, රෝගියා විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය හා රෝගී තත්වයන් සැසඳෙන බවට දක්වා ඇති අතර, පහරදීමක් සනාථ කිරීම සඳහා සාක්ෂිය වන අධිකරණ වෛද්‍ය වාර්තාවේ කරුණු අනුව වගඋත්තර පාර්ශවය විසින් දක්වා සිටිනු ලබන කැඩුනු සින්ක් එකක් මතට වැටීම හේතුවෙන් සැකකරුට තුවාල සිදුවූ බවට කරන කරුණු දැක්වීම බැහැර කිරීමට සිදුවේ.

මෙම කරුණු අනුව, අත්අඩංගුවට ගැනීමේ දිනය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින නමුත්, අධිකරණ වෛද්‍ය වාර්තාවේ කරුණු, සහ පැමිණිල්ලේ කරුණු අනුව පොලිස් අත්අඩංගුවේ සිටියදී පහරදීමක් සිදුව ඇති බවට කරුණු තහවුරු වේ.

**නිගමනය :-**

අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව චින්තක සමන් කුමාර නැමති අයට වගඋත්තරකරුවන් විසින් පහරදී ඇති බවට තහවුරු වන බැවින්ද, අදාළ තුවාල වල ස්වභාවය, රෝගියා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශය හා සැසඳෙන බවට වෛද්‍යවරයා විසින් මත ප්‍රකාශ කර ඇති බැවින්ද, විතානගේ චින්තක සමන් කුමාර යන අයට වගඋත්තරකරුවන් විසින් අමානුෂික අන්දමින් පහරදුන් බවට තහවුරු වන බැවින් ද, වගඋත්තරකරුවන් විසින් වින්දිත පුද්ගලයාගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

එසේම,

ඉෂාරා අංජලී එ. වර්ණ බෝගහවත්ත SCFR 677/2012 නඩුවට අදාළව නිකුත් කරන ලද 2019.06.12 දිනැති තීන්දුව මගින්, 11 වන ව්‍යවස්ථාව තවදුරටත් තහවුරු කර ඇති අතර, අධිකරණයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් විසින් කිසිදු පුද්ගලයෙකු කෲර හා අවමන් සහගත සැලකිල්ලකට ලක් නොකළ යුතු බවයි.

තවද, 1987.05.05 දිනැතිව නිකුත් කර ඇති **<u>අමල් සුදත් සිල්වා එ. කොඩිතුවක්කු</u>** <u>SCFR 186/86</u> දරණ නඩුවේ දක්වා ඇත්තේ, කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මගින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පොලිස් නිලධාරීන් වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

**<u>එච්.එම්. ඉන්දික කාංචන හේමන්ත එ. ස්ථානාධිපති, පොලිස් ස්ථානය, මහව SC FR 411/2012</u>** දරණ නඩුවට අදාළව 2019.11.13 දින නිකුත් කර ඇති තීන්දුව මගින්, අධිකරණය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ අත්අඩංගුවේ සිටින සැකකරුවෙකු පිළිබඳව මානුෂික ලෙස හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට ස්ථානාධිපතිවරයා වගබලා ගත යුතු බවයි.

තවද, 2020.10.22 දිනැතිව නිකුත් කර ඇති **<u>නන්දසේන ලලන්ත අනුරුද්ධ එ. මූලස්ථාන පොලිස් පරීක්ෂක, අනුරාධපුර</u>** <u>SCFR 369/2013</u> දරණ නඩු තීන්දුවේ 11 වන ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පුළුල් විග්‍රහයක් කර ඇති අතර, කිසිදු විටක අත්අඩංගුවේ සිටින සැකකරුවෙකුට අමානුෂික අන්දමින් සැලකීම නොකළ යුතු බවයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටිමු.**

01. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කරදී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට තහවුරු වී ඇති බැවින්, 1, 2, 3 හා 4 වන යන සියළු වගඋත්තරකරුවන් විසින් වෙන් වෙන් වශයෙන් රු. 10,000/- බැගින් වූ රු. 40,000/- මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.

02. මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත යොමු කරනු ලබන අතර, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු බවට දන්වා සිටිනු ලැබේ.

2023.09. 22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**නිමල් ජී. පුංචිහේවා**
**ජ්‍යෙෂ්ඨ නීතිඥ**
**කොමසාරිස්**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

| | | | |
|---|---|---|---|
| පිටපත -: | 01. | පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01. | ඉහත 02 නිර්දේශය අනුව අවශ්‍ය පියවර ගැනීමට |
| | 02. | අධ්‍යක්ෂ, පොලිස් මානව හිමිකම් කොට්ඨාශය, අංක 7, 7 වන මහල, කොටා ටෙරස්, එන්.එම් පෙරේරා මාවත, කොළඹ 08 | අදාල නිලධාරීන්ගේ වර්තමාන සේවා ස්ථානයන් සොයා බලා නිර්දේශය යොමු කිරීමට |

සැයු -: **අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

**B/**